**ශ්‍රී ලංකා තේ මණ්ඩලය - 2023**

**---------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ ,1975 අංක 14 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩල පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල මණ්ඩලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මණ්ඩලය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) මණ්ඩලය විසින් සමාලෝචිත වර්ෂය අවසානය වන විට සම්පූර්ණයෙන් ක්ෂය කරනු ලැබූ පිරිවැය රු. 183,520,144 ක් වූ වත්කම් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතියද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 16 හි 51 ඡේදය ප්‍රකාරව එම වත්කම්වල ඵලදායි ජීව කාලය නැවත තක්සේරු කර ගිණුම් ගත කිරීම හෝ ගිණුම් වල හෙළිදරව් කිරීම සිදුකර නොතිබුණි. | 2024 දෙසැම්බර් 31 දිනට මෙම සියළු වත්කම් නිසි පරිදි ප්‍රත්‍යාගණනය කිරීමටත් මූල්‍ය ප්‍රකාශන තුල හෙළිදරව් කිරීමටත් කටයුතු කරනු ඇත. | සම්පූර්ණයෙන්ම ක්ෂය කර අවසන් වූවද භාවිතා කරනු ලබන වත්කම් සම්බන්ධයෙන් හෙළිදරව් කිරීම කළ යුතුය. |
| (ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 07 ප්‍රකාරව මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙල කිරීමේදි සමාලෝචිත වර්ෂයේ බදු පෙර ලාභයට අදාළ ගැලපීම කළ යුතු වුවත්, මණ්ඩලයේ බදු පසු ලාභය යොදාගෙන මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ගැලපීම් කර තිබුණි. | නිවැරදි කරන ලද මුදල් ප්‍රවාහ ප්‍රකාශනය ඉදිරිපත් කර ඇත. | මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙල කිරීමේදි සමාලෝචිත වර්ෂයේ බදු පෙර ලාභයට අදාළ ගැලපීම් කළ යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2024 වර්ෂයේදී රුසියාවේ මොස්කව් හිදී පැවැත්වීමට නියමිත "Prodexpo 2024" ප්‍රදර්ශනයෙහි වීසා සහ ප්‍රදර්ශන කුටි වෙන්කරවා ගැනීම සඳහා සමාලෝචිත වර්ෂයේදී ගෙවූ රු. 5,573,342 ක් ඉදිරියට කළ ගෙවීම් ලෙස ගිණුම්ගත නොකර සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණු බැවින් එම ප්‍රමාණයෙන් සමාලෝචිත වර්ෂයේ වියදම් අධිගණනය වී ඉදිරියට කළ ගෙවීම් අවප්‍රමාණය වී තිබුණි. | ජ'නල් සටහන් මගින් මේ වන විට අදාල නිවැරදි කිරීම සිදු කර ඇත. | ඉදිරියට කළ ගෙවීම් නිවැරදිව ගිණුම් ගත කළ යුතුය. |
| (ආ) පසුගිය වර්ෂයේදී අඩුවෙන් ගිණුම්ගත කළ රු.4,800,000 ක ජාත්‍යන්තර ප්‍රදර්ශන සහ වෙළෙඳ සල්පිල් සඳහා සහභාගී වීමේ වියදම් ගිණුම්ගත කරනු ලබන ප්‍රවර්ධන හා අලෙවි තැන්පතු ගිණුමට ගැලපීම වෙනුවට රඳවාගත් | ජ'නල් සටහන් මගින් මේ වන විට ප්‍රවර්ධන හා අලෙවි තැන්පතු ගිණුමට අදාල ගැලපීම් සිදු කර ඇත. | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී වියදම් නිවැරදිව ගිණුම් ගතකළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ගත් ඉපයුම් යටතේ ගැලපීම් කිරීම තුළින් එම වටිනාකමෙන් රඳවාගත් ඉපයුම් ගිණුම අවප්‍රමාණය වී, ප්‍රවර්ධන හා අලෙවි තැන්පතු ගිණුම අධිප්‍රමාණය වී තිබුණි. | | |
| (ඈ) | ජාත්‍යන්තර ප්‍රදර්ශන සහ වෙළෙඳ සල්පිල් සඳහා සහභාගී වීම වෙනුවෙන් අපනයනකරුවන් 05 දෙනෙකුගෙන් 2021 මූල්‍ය වර්ෂයේදී ලැබූ අත්තිකාරම් මුදලින් රු.586,550 ක අත්තිකාරම් සමාලෝචිත වර්ෂයේදී ආපසු ගෙවීමේදී ප්‍රවර්ධන හා අලෙවි තැන්පතු ගිණුමට හර කිරීම වෙනුවට ජාත්‍යන්තර ප්‍රදර්ශන සහ වෙළෙඳ සල්පිල් සඳහා සහභාගී වීමේ වියදම් ගිණුමට හර කිරීම නිසා සමාලෝචිත වර්ෂයේ වියදම් රු. 586,550 කින් අධිගණනය වී තිබුණි. | සියලුම ජාත්‍යන්තර ප්‍රදර්ශන හා වෙළඳ සල්පිල් සඳහා සහභාගී වීමේ වියදම් අත්තිකාරම් ගිණුමක් හරහා සිදු කිරීම තුලින් මෙවැනි දෝෂයන් නැවත ඇති නොවීම සඳහා කටයුතු කර ඇත. | ලැබූ අත්තිකාරම් නිරවුල් කිරීමේදී නිවැරදිව ගිණුම් තැබිය යුතුය. |
| (ඈ) | "සිලෝන් ටී" සඳහා ගෝලීය ප්‍රවර්ධන සහ අලෙවි වැඩසටහනෙහි නිර්මාණාත්මක කාර්යයන් 06 ක් සිදුනොකිරීමට මණ්ඩලය විසින් 2022 වර්ෂයේදී තීරණය කර තිබුණද ඒ සඳහා 2017 වර්ෂයේදී සිදුකරන ලද රු.9,414,411 ක වෙන්කිරීම් නැවත ගැලපීමට කටයුතු නොකර සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අලෙවි හා ප්‍රවර්ධන උපචිත වියදම් යටතේ ගිණුම්ගත කර තිබුණු බැවින් එම ප්‍රමාණයෙන් ජංගම වගකීම් අධිගණනය වී ප්‍රවර්ධන හා අලෙවි තැන්පතු අවප්‍රමාණය වී තිබුණි. | මෙම ගෙවීම් සම්බන්ධයෙන් ගැටලුකාරී තත්වයක් මතු වූ හෙයින් ගෙවීම සම්බන්ධව නිසි උපදෙස් ලැබෙන තෙක් මෙම ප්‍රතිපාදිත මුදල තබා ගැනීම සඳහා කටයුතු කර ඇත. | ක්‍රියාත්මක නොකරන කාර්යයන් වෙනුවෙන් සිදුකළ වෙන්කිරීම් නැවත ගැලපීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | මණ්ඩලයෙහි නිම් තේ ඇසුරුම්කරු (SLTB Official Packer) වෙත ගෙවිය යුතු රු.4,534,238 ක් ගෙවියයුතු සේ දෙවරක් ගිණුම්ගත කර තිබුණි. | ජ'නල් සටහන් මගින් මේ වන විට සිදු වූ දෝෂය නිවැරදි කර ඇත. | ගෙවිය යුතු ශේෂ නිවැරදිව ගිණුම් තැබිය යුතුය. |
| (ඊ) | සමාලෝචිත වර්ෂයේදී මණ්ඩලයෙහි නිම් තේ ඇසුරුම්කරු විසින් ප්‍රධාන ගබඩාව වෙත සැපයුම්කරන ලද රු.2,628,416 ක් වටිනා නිම් තේ තොග තේ අලෙවිසැලෙහි විකුණුම් පිරිවැය තුළ ඇතුළත් නොවූ බැවින් වර්ෂයේ අතිරික්තය එම අගයෙන් අධිගණනය වී තිබුණි. | පෙර වසරේ ලාභයට ගැලපීම් සිදු කිරීමෙන් 2023 වර්ෂයේ සිදු වූ දෝෂය ජ'නල් සටහන් මගින් නිවැරදි කර ඇත. | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිම් තේ තොගය නිවැරදිව ගිණුම් ගත කළ යුතුය. |
| (උ) | ප්‍රවර්ධන කටයුතු සඳහා ප්‍රධාන ගබඩාවෙන් නොමිලේ (FOC) සමාලෝචිත වර්ෂය තුළ නිකුත්කර තිබූ රු.905,187 ක ප්‍රවර්ධන ද්‍රව්‍ය (තේ සහ ඇසුරුම් හැර) විදේශ මෙහෙයුම් සඳහා තේ නිකුත් කිරීමේ වියදම් ගිණුමට හර කර, විකුණුම් පිරිවැයට බැර කර තිබුණු බැවින් | පෙර වසරේ ලාභයට ගැලපීම් සිදු කර 2023 වර්ෂයේ සිදු වූ දෝෂය ජ'නල් සටහන් මගින් මේ වන විට නිවැරදි කර | විකුණුම් පිරිවැය සඳහා අවශ්‍යය ගැලපුම් නිවැරදිව සිදුකළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | වර්ෂයේ විකුණුම් පිරිවැය රු.905,187 කින් අඩුවී වියදම් ගිණුම එම ප්‍රමාණයෙන් අධිගණනය වී තිබුණි. | ඇත. | |
| (ඌ) | 2023 දෙසැම්බර් 31 දිනට අවසන් තොග වටිනාකම ගණනය කිරීමේදී ප්‍රධාන ගබඩාවේ පැවති රු.3,774,644 ක රෙදි බෑග් තොග ප්‍රවර්ධන ද්‍රව්‍ය සහ ලිපි ද්‍රව්‍ය යන ගිණුම් ද්විත්වය තුළම ගිණුම්ගත කර තිබුණු බැවින් මූල්‍ය ප්‍රකාශනයේ එම ප්‍රමාණයෙන් පරිභෝජන ද්‍රව්‍ය තොග වටිනාකම අධිගණනය වී අතිරික්තය අවප්‍රමාණය වී තිබුණි. | ජ'නල් සටහන් මගින් පෙර වසරේ ලාභයට ගලපා මේ වන විට නිවැරදි කර ඇත. | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී තොගය නිවැරැදිව ගිණුම්ගත කළ යුතුය. |
| (එ) | 2023 වර්ෂය ආරම්භයේදී රු.51,300,000ක කාබනික පොහොර සහනාධාර ව්‍යාපෘතිය සඳහා වෙන් කිරීමේ ගිණුමක් පැවතියද, 2023 වර්ෂයේදී එම ව්‍යාපෘතිය සඳහා ගෙවන ලද රු.1,100,000 ක සහනාධාර ප්‍රමාණය වෙන්කිරීමේ ගිණුමට හර නොකර වියදම් ගිණුමට හර කර තිබුණු බැවින් වර්ෂයේ අතිරික්තය එම ප්‍රමාණයෙන් අවප්‍රමාණය වී කාබනික පොහොර සහනාධාර ව්‍යාපෘතිය සඳහා වෙන් කිරීම් අධිගණනය වී තිබුණි. | සහනාධාර ප්‍රමාණය වියදම් ගිණුමට හර කිරීම ජ'නල් සටහන මගින් මේ වන විට නිවැරදි කර ඇත. | සහනාධාරලාභීන් වෙත මුදල් නිකුත් කිරීම නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඒ) | තේ අලෙවිසැලෙහි මණ්ඩලය සතු නිමි තේ තොග අලෙවියෙන් (Tea Sale) ලද රු.4,208,900 ක් අපනයන ඇසුරුම් අලෙවියෙන් ලද ආදායම් (Expoter Pack Sale income) ලෙස හඳුනාගෙන තිබුණි. මේ අනුව සමාලෝචිත වර්ෂය අවසානයට තේ අලෙවි ආදායම රු. 4,208,900 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශන තුළ දක්වා තිබුණි. | ඉදිරියේදී නිවැරදිව ගිණුම් සටහන් තැබීමට කටයුතු කරනු ඇත. | මණ්ඩලයේ විකුණුම් ආදායම නිවැරදිව වර්ගීකරණයකර ගිණුම් ගත කළ යුතුය. |

### 1.5.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විෂයය | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම රු. | අනුරූපී වාර්තා අනුව වටිනාකම රු. | වෙනස රු. | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| රසායනාගර ආදායම | 31,589,500 | 42,927,750 | 11,338,250 | රසායනාගාර අංශය විසින් සිදු කරන ලද සියලුම පරීක්ෂණ අතුරින් ගාස්තු අය කිරීම් හෝ නොකිරීම තේ කොමසාරිස් අංශය විසින් තීරණය කරන අතර අය නොකරනු | මණ්ඩලයේ රසායනාගාර පරීක්ෂණ සම්බන්ධ අභ්‍යන්තර පාලනය ශක්තිමත් කර එම ආදායම නිවැරදිව ගිණුම්ගතකළ යුතුය. |

| | | |
|---|---|---|
| | ලබන සාම්පල සඳහා වන රසායනාගාර ආදායම නැවත ගැලපීමට තේ කොමසාරිස් අංශය විසින් රසායනාගාර අංශය වෙත දැනුම් නොදීම මත මෙම ආදායම් පරස්පරතාවය නිර්මාණය වීම සිදුව ඇත. | |

**1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්**

**1.6.1 ලැබිය යුතු මුදල්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2017 වර්ෂයේදී ගෝලීය තේ සංග්‍රහය වෙනුවෙන් විදේශ තානාපති කාර්යාල වෙත ලබා දුන් රු. 51,604,457 ක මුදලින් රටවල් 15 කින් ඉතිරි වූ රු. 918,679 ක මුදල සහ චීනය, එක්සත් රාජධානිය, සහ මොස්කව් යන රටවල තානාපති කාර්යාලවලින් ලැබිය යුතු රු.868,578 ක මුදල අදාළ තානාපති කායීාලවලින් ශ්‍රී ලංකා විදේශ කටයුතු අමාත්‍යාංශය වෙත ප්‍රේෂණය කර තිබුණු නමුත් විගණිත දින වන විටත් එම අමාත්‍යාංශයෙන් මුදල් ගෙන්වා ගැනීමට කටයුතු නොකර ලැබිය යුතු ශේෂයක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | විදේශ කටයුතු අමාත්‍යාංශය විසින් පොදු තැන්පත් ගිණුමේ තැන්පත් කර ඇති මුදල් කඩිනමින් ශ්‍රී ලංකා තේ මණ්ඩලය වෙත මුදාහරින බව දන්වා ඇති අතර මේ පිළිබඳ පසුවිපරම් කරමින් ඇත. | අදාල ආයතන සමඟ සාකච්ඡාකර ලැබිය යුතු මුදල් නිරවුල් කරගැනීමට නොපමාව පියවර ගත යුතුය. |
| (ආ) එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ ස්ථාපිත කර ඇති ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ තේ ප්‍රවර්ධන ඒකකයේ කටයුතු 2022 අප්‍රේල් 30 දින සිට නවතා දැමීමට 2022 පෙබරවාරි 28 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල තීරණ අංක 2022/513/10 න් තීරණය කර තිබුණද 2023 දෙසැම්බර් 31 දින වන විට ඒකකයේ ස්ථාවර වත්කම් හා ජංගම ගිණුමේ ශේෂයන් පිළිවෙලින් රු.1,849,494 ක් සහ රු.8,237,377 ක් නිරවුල් කරගෙන නොතිබුණි. | අවස්ථා කිහිපයකදී ජංගම ගිණුමේ ශේෂය පිළිබඳව තනාපති කාර්යාලයට දන්වා යැවූ නමුදු ඔවුන් එයට ප්‍රතිචාර දක්වා නොමැත. තේ ප්‍රවර්ධන ඒකකය භාරයේ පැවති ස්ථාවර වත්කම් කොන්සියුලර් කාර්යාලය වෙත මාරු කර ඇති අතර ඒ පිළිබඳ වාර්තා ගෙන්වා ගෙන වත්කම් ගැලපීම් කිරීමට 2024 වර්ෂයේදී කටයුතු කරනු ඇත. | ස්ථාවර වත්කම් හා ජංගම ගිණුම් ශේෂයන් නිරවුල් කරගැනීමට නොපමාව පියවර ගත යුතුය. |

| | | |
|---|---|---|
| (ඇ) එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ ස්ථාපිත කර ඇති ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ තේ ප්‍රවර්ධන ඒකකය වෙනුවෙන් 2013 වර්ෂයේ මිලට ගෙන තිබූ පිරිවැය රු.2,366,735ක් වූ මෝටර් රථය 2023 අගෝස්තු 31 දින (AED 12,500) රු.1,098,063 ක මුදලකට විකිණීමෙන් ලද මුදල ශ්‍රී ලංකා විදේශ කටයුතු අමාත්‍යාංශයට ප්‍රේෂණය කර තිබුණද, 2024 මාර්තු වන විටත් එම මුදල මණ්ඩලයට ලැබී නොතිබුණු අතර ලැබිය යුතු ශේෂයක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | විදේශ කටයුතු අමාත්‍යාංශය විසින් ශ්‍රී ලංකා තේ මණ්ඩලය වෙත ප්‍රේෂණය කිරීමට කටයුතු කර නොමැත. | මණ්ඩලය වෙත ලැබියයුතු මුදල් නිරවුල් කරගැනීමට නොපමාව පියවරගත යුතුය. |

### 1.6.2 ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| තේ දළු හිමියන් වෙත නියමිත මිල නොගෙවීම නිසා කරන ලද පැමිණිලි වෙනුවෙන් ගෙවීමට සහ තේ කර්මාන්තශාලාවල අයිතිය වෙනස්වීමේදී දළු හිමියන් වෙත ගෙවීම සඳහා තේ කම්හල්හිමියන් විසින් මණ්ඩලයේ තැන්පත් කර ඇති නමුත් සමාලෝචිත වර්ෂය අවසානය තෙක් නිසි පරිදි නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණු රු.90,304,143 ක තැන්පතු පැවති අතර ඒ තුළ වසර 5 ඉක්මවූ තැන්පතු ප්‍රමාණය රු. 4,759,784 ක් විය. | තේ කම්හල් හිමියන් විසින් තේ දළු සපයන්නන් වෙත ගෙවීම් කිරීමට ඇති මුදල් ගෙවීම් කටයුතු කිරීම සඳහා අවශ්‍ය අනුමැතිය ප්‍රාදේශීය කාර්යාල වෙත දන්වා යවා ඇති අතර ප්‍රාදේශීය කාර්යාල මඟින් අදාළ කටයුතු සිදු කර තේ කොමසාරිස් අංශය වෙත දැනුම් දීමෙන් පසු ඒ සම්බන්ධ ප්‍රගතිය ඉදිරි මාස 03කදී නිරවුල් කර විගණන අංශය වෙත වාර්තා කිරීමට කටයුතු කරනු ඇත. | ගෙවිය යුතු පාර්ශවයන් නිවැරදිව හඳුනාගෙන ඔවුන්ට හිමි මුදල් කඩිනමින් නිරවුල් කළ යුතුය. |

### 1.6.3 අත්තිකාරම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මණ්ඩලය විසින් තේ පැළ මිලියන 25 ක විශේෂ ව්‍යාපෘතිය සඳහා කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය වෙත 2021 ජූලි 14 දින ලබා දෙන ලද රු.125,000,000 ක අත්තිකාරම් මුදලින් රු.33,470,665 ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අත්තිකාරම් ගිණුමෙහි ඇතුළත්ව තිබුණි. අධිකාරිය සමඟ එළඹි අවබෝධතා ගිවිසුමෙහි කාලයද 2023 දෙසැම්බර් 31 | ගෙවීම් වවුචර්පත් කඩිනමින් ලබා දෙන බව කුඩා තේවතු සංවර්ධන අධිකාරිය විසින් දැනුම් දී ඇත. එම වවුචර්පත් ලැබුණු විගස අදාල ගිණුම් ගැලපිලි සිදු කොට වවුචර්පත් විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ඇත. | ගිවිසුම් ප්‍රකාරව ව්‍යාපෘති කාලය අවසන් බැවින් ඉතිරි මුදල් නැවත අයකර ගැනීමට හා අදාළ අත්තිකාරම් පියවා ගැනීමට මණ්ඩලය විසින් කඩිනමින් පියවරගත යුතුය. |

දිනෙන් අවසන් වී ඇති අතර ගිවිසුම් ප්‍රකාරව ව්‍යාපෘතිය සඳහා උපයෝජනය කර නොමැති වටිනාකමක් පවතී නම් නැවත අයකර ගැනීමට හා අදාල අත්තිකාරම් පියවා ගැනීමට මණ්ඩලය විසින් කටයුතු කර නොතිබුණි.

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 2010 ඔක්තෝබර් 27 දිනැති අංක 1677/14 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි 02 හා 03 වන නියෝග | තේ අපනයනය කිරීම සඳහා ඉඩ දෙමින් ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් රේගු බදු ප්‍රකාශයේ (CUSDEC) අවසරය ලබාදෙන වේලාවේදී සෑම තේ කිලෝග්‍රෑමයක් සඳහා සෑම ලියාපදිංචි තේ අපනයනකරුවකුගෙන්ම රුපියල් 3.50 ක බද්දක් අයකිරීමේ ගැසට් පත්‍රය 2021 දෙසැම්බර් 14 දිනැති, අංක 2258/15 දරන ගැසට් පත්‍රය මගින් අහෝසි කර තිබියදී 2021 දෙසැම්බර් 15 සිට 2023 අගෝස්තු 04 දක්වා මණ්ඩලය විසින් තේ අපනයන කරුවන්ගෙන් රු.1,003,428,373 ක් අයකර ගෙන තිබුණි. | තේ මණ්ඩල පනතේ 25 වන වගන්තිය ප්‍රකාරව බදු අයකිරීම නිත්‍යානුකූල නොවන බව නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව දන්වා තිබීමෙන් පසු 2021.12.14 දිනැති 2258/15 ගැසට් පත්‍රය මඟින් 2010.10.29 දිනැති 1677/14 ගැසට් පත්‍රය අහෝසි කර තිබුණි. එසේ වුවද අධ්‍යක්ෂ මණ්ඩලයේ එකඟත්වය මත රු.3 ක බදු මුදල අපනයනකරුවන් විසින් තේ මණ්ඩලය වෙත ගෙවා ඇත. | නියෝග සෑදීමේදී එහි නෛතික ප්‍රතිපාදන පිළිබඳ සැළකිලිමත් වෙමින් විධිමත්ව හා කාලානුරූපීව නියෝග පැනවීම හා ක්‍රියාත්මක කිරීම සිදු කළ යුතුය. |
| (ආ) 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 3 ඡේදය | මණ්ඩලයේ මානව සම්පත් කළමනාකරණය ඇතුළු මෙහෙයුම් ක්‍රියාවලිය හා පාලනයන් පිළිබඳව මෙහෙයුම් අත්පොත සකස්කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂය අවසානය දක්වා මණ්ඩලය එහි කටයුතු අවසන් කර නොතිබුණි. | මෙහෙයුම් අත්පොත කෙටුම්පත් කිරීමේ කටයුතු මේ වන විට සිදුකර ඇත. | මෙහෙයුම් අත්පොත සකස්කර එහි කාර්යයන් විධිමත් අනුමැතියක් යටතේ ක්‍රියාත්මක කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 194,872,796 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.210,289,737 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 15,416,941 ක පිරිහීමක් නිරීක්ෂණය විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සංවර්ධන, පරිපාලන හා මූල්‍ය වියදම් පිළිවෙලින් රු. 190,785,879 කින්, රු. 59,914,670 කින් හා රු.72,914කින් ඉහළ යාම මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

| විෂයය | 2023 රු. | 2022 රු. | වෙනස රු. | වෙනසේ ප්‍රතිශතය සියයට |
|---|---|---|---|---|
| ------- | ------- | ------- | ------ | ------------ |
| ආදායම<br>--------- | | | | |
| රසායනාගාර ආදායම | 31,589,500 | 19,802,796 | 11,786,704 | 60 |
| සංවර්ධන වියදම් වෙනුවෙන් ප්‍රවර්ධන හා අළෙවිකරණ බදු අරමුදලින් ලද රු.1.50 ආදායම | 212,786,346 | - | 212,786,346 | 100 |
| සංවර්ධන වියදම් වෙනුවෙන් බලපත්‍ර ගාස්තු ආදායමෙන් ලද රු.1.50 ආදායම | 154,483,798 | - | 154,483,798 | 100 |
| ප්‍රවර්ධන හා අලෙවිකරණ බදු අරමුදල | 150,000,000 | 409,228,000 | 259,228,000 | 63 |
| ස්ථාවර තැන්පතු පොලී අදායම | 112,610,616 | 75,129,356 | 37,481,260 | 50 |
| වාණිජ ක්‍රියාකාරකම් මගින් ඉපැයූ ලාභය | 21,812,366 | 10,200,165 | 11,612,201 | 114 |
| අනෙකුත් ආදයම් | 11,927,460 | 8,656,261 | 3,271,199 | 38 |
| වියදම්<br>------- | | | | |
| සංවර්ධන වියදම් | 335,444,475 | 144,658,596 | 190,785,879 | 132 |
| මූල්‍ය වියදම | 247,508 | 174,594 | 72,914 | 42 |
| පරිපාලන වියදම් | 564,794,804 | 504,880,134 | 59,914,670 | 12 |

සංවර්ධන වියදම් වෙනුවෙන් ප්‍රවර්ධන හා අළෙවිකරණ බදු අරමුදලින් සහ බලපත්‍ර ගාස්තු ආදායමෙන් ලද ආදායම රු.367,270,144 ක් වී තිබූ අතර ඉකුත් වර්ෂය හා සැසඳීමේදී තේ ප්‍රවර්ධන හා අලෙවිකරණ බදු අරමුදලේ පොලී ආදායමෙන් තේ මණ්ඩලය වෙත මාරු කරන ලද මුදල් ප්‍රමාණය සියයට 63 කින් අඩු වී තිබූ අතර ,රසායනාගාර ආදායම් සියයට 60 කින් ද , ස්ථාවර තැන්පතු පොලී අදායම සියයට 50 කින් ද, වාණිජ ක්‍රියාකාරකම් මගින් ඉපැයූ ලාභය සියයට 114 කින් ද වැඩිවී තිබුණි. සංවර්ධන , මූල්‍ය සහ පරිපාලන යන වියදම් පිළිවෙලින් සියයට 132 කින් , සියයට 42 කින් සහ සියයට 12 කින් වැඩි වී තිබුණි.

## 2.3 අනුපාත විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂයේ ජංගම හා ක්ෂණික වත්කම් අනුපාතයන් 3 : 1 ක් හා 3.1 ක් වූ අතර පසුගිය වර්ෂයේදි එම අනුපාත 7: 1 ක් හා 7:1 ක් වී තිබුණි. පෙර වර්ෂයට සාපේක්ෂව ජංගම වත්කම් සියයට 29 කින් වැඩි වී තිබුණු නමුත් ඉරානය සමග ඇති කරගත් තෙල් ගිවිසුම යටතේ 2023 වර්ෂයේදී මණ්ඩලයට ලැබුණු අපනයනකරුවන් වෙත ගෙවියයුතු රු.3,732,026,204ක් පැවතීම තුළින් ජංගම වගකීම් සියයට 184 කින් වැඩි වී තිබීම හේතුවෙන් මෙම අනුපාත පසුගිය වර්ෂය හා සැසඳීමේදි සියයට 55 කින් අඩු වි තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කළුතර ප්‍රාදේශීය කාර්යාලය පවත්වා ගෙන යනු ලබන රූඩ් 1. පර්චස් 20 ක වර්ග ප්‍රමාණයක් වූ ඉඩම 2014 වර්ෂයේ සිට අවුරුදු 30 ක කාලයක් සඳහා ශ්‍රී ලංකා තේ මණ්ඩලය වෙත දීර්සකාලීන බදු පදනම මත ලබා දීමට ඉඩම් කොමසාරිස් ජනරාල් විසින් බස්නාහිර පළාත්, පළාත් ඉඩම් කොමසාරිස් වෙත ඉදිරිපත් කරන ලද අංක 4/10/37833 දරන ලිපියෙන් තහවුරු වුවද, මෙතෙක් බදු ගිවිසුමක් අත්සන් කර නොතිබුණි . | ශ්‍රී ලංකා තේ මණ්ඩලය ඉල්ලීම් කලද බදු ගිවිසුම සකස් කිරීම සිදු කරනුයේ පාලින්ද නුවර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් වන බැවින් මෙතෙක් එම බදු ගිවිසුම සකසා ඉදරිපත් කර නොතිබීම හේතුවෙන් මෙම ගිවිසුම්ගත වීම ප්‍රමාද වී ඇත. | නීත්‍යානුකූල බදු ගිවිසුමකට එළඹීම තුළින් වත්කම් පාලනය විධිමත් කළ යුතුය. |
| (ආ) | නුවරඑළිය ප්‍රාදේශීය කාර්යාලය පවත්වාගෙන යනු ලබන ඉඩමේ අයිතිය කැලණි වැලි සමාගමෙන් හා නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් මගින් නීත්‍යානුකූලව මණ්ඩලය වෙත පවරා ගෙන නොතිබුණි. | නුවරඑළිය ප්‍රාදේශීය කායීාලය ඉදි කර ඇති ඉඩම ශ්‍රී ලංකා තේ මණ්ඩලයට පවරා ගැනීමට අදාලව කටයුතු සිදු වෙමින් පවතින අතර මෙම ඉඩම පවරා ගැනීම සම්බන්ධව ක්‍රියා කිරීමේදී අනෙකුත් රාජ්‍ය ආයතන සමඟ සම්බන්ධව සිදු කිරීම හේතුවෙන් ප්‍රමාද වන බවත් එය ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ පාලනයෙන් බැහැර කරුණක් වනු ඇත. | නීත්‍යානුකූල හිමිකමක් නොමැති ඉඩමක ගොඩනැගිලි ඉදිකිරීම සිදුකර ඇති බැවින් ඉඩමේ නීත්‍යානුකූල අයිතිය මණ්ඩලයට ලබාගැනීමට නොපමාව කටයුතු කළ යුතුය. |
| (ඇ) | ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ නුවරඑළිය ප්‍රාදේශීය කාර්යාලයේ තේ අලෙවිසැලෙන් 2019 වර්ෂයේ සිට 2023 දෙසැම්බර් 31 දින දක්වා මණ්ඩලයට අයවිය යුතු රු.986,253 ක බදු මුදල අයකර ගැනිමට මණ්ඩලය අපොහොසත්ව තිබුණි | පාස්කු සහ කොවිඩ් වසංගතය හේතුවෙන් සංචාරක ව්‍යාපාරයේ පසුබෑම මත බදුකරු විසින් සහනදායි විසඳුමක් ශ්‍රී ලංකා තේ මණ්ඩලයෙන් අපේක්ෂා කරන ලදුව අධ්‍යක්ෂ මණ්ඩල තීරණය මත 2021 අප්‍රේල් මස සිට 2021 සැප්තැම්බර් දක්වා බදුකුළී වාරිකයට සහනයක් ලබා දීමෙන් පසුව බදුකරුගෙන් ලැබිය යුතු සියළු අය කිරීම් ගැලපීමෙන් පසු 2022 වර්ෂය | බාහිර පාර්ශවයන්ගෙන් අයකරගත යුතු කුළී ආදායම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| | අවසානයේ රු.986,253 ක් අයවිය යුතුව ඇත. | |
| (ඈ) 2014 වර්ෂයේදී ආරම්භ කරන ලද "ටී මෝමන්ට්ස් " නම් වූ කොළඹ තේ අලෙවි මධ්‍යස්ථානයෙන් මණ්ඩලයට රු.62,603,006 ක අලාභයක් සිදු වී තිබූ අතර වැවිලි කර්මාන්ත අමාත්‍යාංශ ලේකම්ගේ 2016 දෙසැම්බර් 06 දිනැති ලිපිය මඟින් අපරික්ෂාකාරී ලෙස කටයුතුකළ නිලධාරීන්ට විරුද්ධව සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතු බව සභාපති වෙත දන්වා තිබුණද, මේ වන විටත් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | ශක්‍යතා අධ්‍යනයකින් තොරව ආරම්භ කිරීම හා අපරික්ෂාකාරී ලෙස කටයුතු කල නිලධාරීන්ට විරුද්ධව මූලික විමර්ශනයක් සිදු කිරීම සඳහා කටයුතු කිරීමට සටහන් කර ගෙන ඇත. | මෙම අලාභය සඳහා වගකිව යුතු පාර්ශවයන් හඳුනාගෙන අලාභ අයකරගැනීමට විධිමත් පියවරක් ගත යුතුය. |
| (ඉ) 2009 වර්ෂයේදී රු.32,132,088 කට මිලදී ගන්නා ලද පළිබෝධනාශක රසායනික සංඝටක විශ්ලේෂණ යන්ත්‍රය (Liquid Chromatography Mass Spectrometer) අපේක්ෂිත පිරිවිතරයන්ට අනුකූල නොවීම හේතුවෙන් මේ දක්වා භාවිතයට ගෙන නොතිබුණු අතර , මිලදී ගැනීමේදී සිදුව ඇති අක්‍රමිකතා පිළිබඳ එවකට රසායනාගාරයට අනුයුක්තව සේවය කළ සහකාර අධ්‍යක්ෂකවරයාට එරෙහිව චෝදනා පත්‍රයක් නිකුත් කර සිදුකළ විනය පරීක්ෂණයේ තීරණ නිෂ්ප්‍රභා කර නැවත විනය පරීක්ෂණයක් කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කර තිබුණද සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අවශ්‍ය විනය ක්‍රියාමාර්ග ගැනීමට මණ්ඩලයට නොහැකි වී තිබුණි. චෝදනා ලත් සහකාර අධ්‍යක්ෂවරයා 2022 වර්ෂය අවසානයේ විශ්‍රාම ගොස් තිබුණු අතර මණ්ඩලය විසින් රු.1,559,775 ක පරිතෝෂික මුදල ද නිලධාරියා වෙත ගෙවීම් කර තිබුණු අතර විනය පරීක්ෂණ සඳහා රු. 205,454 ක මුදලක්ද මණ්ඩලය විසින් වියදම් කර තිබුණි. | අදාල කාරණා සඳහා සිදුකරන ලද විමර්ශන වාර්තාව 2024 මැයි 03 අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කරන ලද අතර අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය පරිදි නීතිපතිගේ උපදෙස් ලබා ගැනීමට කටයුතු කරනු ඇත. | පිරිවිතරයන්ට අනුකූල නොවූ ප්‍රසම්පාදනය හේතුවෙන් මණ්ඩලයට සිදුවී ඇති අලාභය වගකිවයුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට නොපමාව කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ඊ) 2012 ජුනි 19 දින පැවති ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ නියෝග අංක 11 ප්‍රකාරව මණ්ඩලය විසින් 2003 වර්ෂයේදී ජනතා වතු සංවර්ධන මණ්ඩලයට ලබාදුන් රු.25,000,000 ක ණය මුදලක් වෙනුවෙන් ජනතා වතු සංවර්ධන මණ්ඩලයට අයත් හන්තාන පිහිටි "Ceylon Tea Museum" හි අයිතිය තේ මණ්ඩලයට පැවරීමට තීරණය වී තිබුණු නමුත්, වර්ෂ 10 කට වැඩි කාලයක් ගත වුවද මේ දක්වා වත්කම් හි අයිතිය පවරා ගැනීමට හෝ, ණය මුදල් ආපසු අයකර ගැනීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. එසේම 2020 වර්ෂයේදී අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතියෙන් තේ මණ්ඩලය විසින් ජනතා වතු සංවර්ධන මණ්ඩලයට රු.10,000,000 ක ණය මුදලක් ලබාදී තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසානයට ඉන් රු.1,000,000 ක් පමණක් අයකරගෙන තිබුණි. | ණය මුදල පිළිබඳ ඉදිරියේදී සාකච්ජා කර නිශ්චිත එකගතාවයකට එළඹීමට කටයුතු කරනු ඇත. | මණ්ඩලය විසින් බාහිර පාර්ශවයක් වෙත ලබා දී ඇති ණය මුදල අයකර ගැනීමට හෝ විධිමත් පරිදි නිරවුල් කර ගැනීමට නොපමාව කටයුතු කළ යුතුය. |
| (උ) ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ රු.මිලියන 750 ක මූල්‍ය දායකත්වයෙන් කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය මගින් ක්‍රියාත්මක කරනු ලබන සෘජු තේ වගා ව්‍යාපෘතිය සඳහා කුඩා තේ වතු සංවර්ධන අධිකාරියට සමාලෝචිත වර්ෂයේ රු.මිලියන 150 ක මුදලක් ලබා දී තිබුණු අතර මේ සම්බන්ධයෙන් දෙපාර්ශවය අතර කිසිදු අවබෝධතා ගිවිසුමකට එළඹී නොතිබුණි. | වැවිලි අමාත්‍යාංශයේ පැවති සාකච්ජාවේ දී තීරණය වූ පරිදි හා වැවිලි අමාත්‍යාංශයේ උපදෙස් පරිදි 2023/526/107 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා මගින් ලබා දුන් අනුමැතියට යටත්ව මෙම සෘජු තේ වගා ව්‍යාපෘතිය ආරම්භ වූ අතර මේ දක්වා දෙපාර්ශවය අතර කිසිදු අවබෝධතා ගිවිසුමකට එළඹී නොමැත. | දෙපාර්ශවය අතර සිදුවන ව්‍යාපෘති කාර්යයන් හා අරමුදල් සම්බන්ධයෙන් විධිමත් ගිවිසුමකට එළඹීමට කටයුතු කළ යුතුය. |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) "සිලෝන් ටී" සඳහා ගෝලීය ප්‍රවර්ධන සහ අලෙවි වැඩසටහන යටතේ සාම්ප්‍රදායික ඉහල මට්ටමේ ප්‍රචාරණය සඳහා | ගෝලීය ප්‍රවර්ධන වැඩසටහන යටතේ නිර්මාණාත්මක කාර්යයන් සම්පූර්ණ කිරීමට අදාළ කොන්ත්‍රාත්තුව ප්‍රදානය කරනුයේ 2016.11.06 වන දින අතර ඒ | මෙම නිර්මාණාත්මක කාර්යයන් හි වර්තමාන සහ ඉදිරි භාවිතයට ඇති හැකියාව පිළිබඳ නිසි |

| | | | |
|---|---|---|---|
| | රූපවාහිනි මාධ්‍යය යොදාගැනීමට ඉංග්‍රීසි භාෂාවෙන් රූපවාහිනි වෙළෙඳ දැන්වීම නිර්මාණයට හා එය චීන, ජපන් ,අරාබි,යුක්රේන්, ජර්මන් සහ තුර්කි භාෂා මාධ්‍යයන් වලට සිදුකරන ලද පරිවර්තන සඳහාද 2016 සිට 2020 වර්ෂය දක්වා රු.174,332,138 ක වියදමක් දරා තිබුණද එම වෙළෙඳ දැන්වීම නිර්මාණය කිරීමේ මූලික අරමුණ වූ රූපවාහිනි මාධ්‍ය තුළ ප්‍රචාරණය සිදුකර ගැනීමට අවශ්‍යය මාධ්‍ය මිලදී ගැනීම හා ඒ සම්බන්ධ සැලසුම් සකස්කර නොතිබුණු බැවින් රූපවාහිනි මාධ්‍ය තුළ ප්‍රචාරණයක් සිදුකර නොතිබුණි. එසේම රු. 39,832,808 ක වියදමින් නිර්මාණය කරන ලද නිර්මාණාත්මක කාර්යයන් 31 ක්ද සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අදාළ කාර්යයන් වෙනුවෙන් උපයෝජනය කර නොමැති බව නිරීක්ෂණය විය. | අනුව අදාළ අංගයන් 31 ක් සම්පූර්ණ කර ඇතත් මාධ්‍ය සැලසුම් සකස් කිරීම හා මාධ්‍ය මිලදී ගැනීම සම්බන්ධ අදාළ කොන්ත්‍රාත්තුව 2018.03.21 වන දින ප්‍රදානය කර ඇති අතර ඒ අනුව 2023.03.20 වනවිට සම්පූර්ණ කරනුයේ මාධ්‍ය සමීක්ෂණය හා මාධ්‍ය මිලදී ගැනීමට අවශ්‍ය සැලසුම් සකස් කිරීමට පමණි. මෙම ප්‍රමාදය සඳහා කොවිඩ් වසංගත තත්ත්වය බලපෑම් කරන ලදී. 2019 මාධ්‍ය මිලදී ගැනීමට අදාළ ටෙන්ඩර් පටිපාටිය රුසියාව හා යුක්රේනය ආශ්‍රිතව ආරම්භ වුවත් බාහිර බාධකයන් හා ශ්‍රී ලාංකීය ප්‍රසම්පාදන ක්‍රමවේදය නොගැලපීම හේතුකොට මාධ්‍ය මිලදී ගැනීමේ ක්‍රමවේදය හා ගෝලීය ප්‍රවර්ධන කටයුතු ආරම්භ කිරීම ප්‍රමාද වී ඇත. | ඇගයීමක් සිදුකර ඒ මත පදනම්ව ගෝලීය ප්‍රවර්ධන සහ අලෙවිකරණ වැඩසටහන් සඳහා උපයෝජනය කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරනු ලබන “සිලෝන් ටී” සඳහා ගෝලීය ප්‍රවර්ධන සහ අලෙවි වැඩසටහනේ නිර්මාණාත්මක කටයුතු යටතේ www.pureceylontea.com ප්‍රධාන වෙබ් අඩවිය සහ අනෙකුත් භාෂා පරිවර්තිත වෙබ් අඩවිවල ප්‍රධාන මූලිකාංග හා වෙබ් අඩවිය තුළින් සෘජුවම අපනයන හා විකුණුම්කරුවන් වෙතින් සිලෝන් ටී ඇණවුම් කිරීමට හැකි පරිදි අන්තර්ජාල මිලදී ගැනීම් සඳහා වන මාර්ගගත පහසුකම් සපයාදීම සිදුවන Where to buy හි URL වෙත විදේශීය පරිශීලක ප්‍රවේශවීම් වැනි කාර්යඵල පිළිබඳව ලබා ගන්නා ලද දත්ත පරිදි එම ප්‍රවේශවීම් ඉතා අඩු මට්ටමක පවතින බව පාරිභෝගික සම්බන්ධතා වෙබ් | මෙම කර්තව්‍යයේ ඌන උපයෝජනය සිදු වන්නේ ගෝලීය ප්‍රවර්ධන වැඩසටහන ක්‍රියාත්මක නොවීම හා “Marketing Cell” ස්ථාපනය නොවීම යන කරුණු මතය. ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ ක්‍රියාත්මක කරන ගෝලීය තේ ප්‍රචාරණ වැඩසටහනෙහි මෙම කාර්යයද ඇතුළුව මෙතෙක් සිදු කරන ලද සමස්ථ කටයුතු හා ක්‍රියාවලිය සම්බන්ධව මූලික විමර්ශනයක් සිදු කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කර ඇත. | අන්තර් ජාතික වශයෙන් පාරිභෝගික/පරිශීලක ආකර්ෂණය වෙබ් අඩවිය වෙත ලගා කර ගැනීම තුළින් ගෝලීය ප්‍රවර්ධන වැඩසටහන යටතේ අපේක්ෂිත අරමුණු ලඟාකර ගැනීම සඳහා වෙබ් අඩවිය ඵලදායී ලෙස උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | අඩවිය පිළිබඳ දත්ත විශ්ලේෂණයේදී නිරීක්ෂණය වූ අතර, අන්තර්ජාතික වශයෙන් පාරිභෝගික/පරිශීලක ආකර්ෂණය වෙබ් අඩවිය වෙත ලැබී නොමැති බව සහ ඒ අනුව රු.172,939,768 ක පිරිවැයක් යටතේ නිර්මාණය කරන ලද වෙබ් අඩවිය තුළින් ගෝලීය ප්‍රවර්ධන වැඩසටහන යටතේ අපේක්ෂිත අරමුණු ලඟාකර ගැනීම සඳහා ඵලදායී කාර්යභාරයක් සිදු නොවන බවද වෙබ් අඩවිය පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. | | |
| (ඇ) | ශ්‍රී ලංකා තේ ගෝලීය වශයෙන් ප්‍රවර්ධනය කිරීම සඳහා මාධ්‍ය සමීක්ෂණ හා මාධ්‍ය සැලසුම් සකස් කිරීම වෙනුවෙන් 2019 සිට 2023 කාලපරිච්ඡේදය තුළ රු.107,088,740 ක මුදලක් වියදම් කර තිබූ නමුත් සකස් කර තිබූ මාධ්‍ය සැළසුම් අතුරින් චිලී රාජ්‍ය සඳහා ඉදිරිපත් කර තිබූ මාධ්‍ය සැලසුම හැරුණු කොට අනෙක් සියලුම රටවල් සඳහා ඉදිරිපත් කර තිබුණු මාධ්‍ය සැළසුම්වල කාලය ඉකුත් වී තිබුණු නමුත් එම කායීයන් සමාලෝචිත වර්ෂය අවසානය දක්වා ක්‍රියාත්මක කර නොතිබුණි. | මාධ්‍ය සැලසුම් ක්‍රියාත්මක කිරීම අදාළ කාල පරාසය තුළ සිදු නොවූ බව පිළිගනිමි. | මාධ්‍ය සැලසුම්වල වර්තමාන සහ ඉදිරි භාවිතයට ඇති හැකියාව පිළිබඳ නිසි ඇගයීමක් සිදුකර එම සැලසුම් ගෝලීය ප්‍රවර්ධන සහ අලෙවිකරණ වැඩසටහන් සඳහා උපයෝජනය කරගත යුතුය. |
| (ඈ) | 2018 වර්ෂයේ සිට වසර දෙකක කාල දිගුවකුත් සමඟ 2023 මාර්තු 20 දක්වා වූ කාලය තුළදී ගිවිසුම්ගත පුද්ගලික සමාගම විසින් සිදු කළ යුතු කාර්යය අතුරින් තෝරාගත් රටවල් 12 තුළ මාධ්‍ය සමීක්ෂණ හා මාධ්‍ය සැලසුම් කටයුතු පමණක් අවසන් කර තිබූ අතර මාධ්‍ය උපලේඛනගත කිරීම, මාධ්‍ය මිලදී ගැනීමේ උපදේශක වශයෙන් කටයුතු කිරීම, ප්‍රධාන කාර්යය සාධන දර්ශක යෝජනා කිරීම සහ සංවර්ධනය කිරීම, | ශ්‍රී ලංකා තේ මණ්ඩලය මගින් මාධ්‍ය මිලදී ගැනීම හා ගෝලීය ප්‍රවර්ධන කාර්යය දියත් කිරීමට යටත්ව ඩෙන්ට්සු ග්‍රාන්ට් ආයතනය මගින් මාධ්‍ය උපලේඛන ගත කිරීම හා මාධ්‍ය මිලදී ගැනීම සඳහා උපදේශනය සිදු විය යුතු අතර එමෙන්ම මාධ්‍ය මිලදී ගැනීමට යටත්ව පූර්ණ කාලීන ඩිජිටල් මාධ්‍ය කළමනාකරුවකු මාර්ගයෙන් Digital Media Optimization සිදු කිරීමටත් යෝජිතව පැවතියේය.එමෙන්ම ගෝලීය ප්‍රවර්ධන කාර්යයේ ඵලදායිතාව ඇගයීම උපදේශකගේ කාර්යභාරයද වන්නේය. එනමුත් මෙම ගෝලීය ප්‍රචාරණ මාධ්‍ය | නියමිත කාලසීමාවන් තුළදී වැඩසටහනට අදාල ගිවිසුම්ගත කාර්යයන් ප්‍රශස්ථ මට්ටමින් සම්පූර්ණ කිරීමට කටයුතු කළයුතුය. |

| | | | |
|---|---|---|---|
| | මාධ්‍ය වැඩසටහනේ කාර්යය සාධනය ඇගයීම සහ පූර්ණ කාලීන ඩිජිටල් මාධ්‍ය කළමනාකරුවෙකු පත් කිරීම ආදී ගිවිසුම්ගත කායීයන් සම්පූර්ණ කිරීම සිදුවී නොතිබුණි. | මිලදී ගැනීම සඳහා කැඳවන ලද එකදු ටෙන්ඩරයක්වත් පවත්නා ප්‍රසම්පාදන පටිපාටින් හා නොගැලපීම හේතු කොට සාර්ථක නොවීම හේතුවෙන් ඉහත කාර්යය ඩෙන්ට්සු ග්‍රාන්ට් පුද්ගලික අංශයට සිදු කිරීමට අවස්ථාවක් උදා වී නැත.එමෙන්ම මේ සඳහා ඇස්තමේන්තු ගත මුදල ද වැය කර නැත. | |
| (ඉ) | ශ්‍රී ලංකා තේ ප්‍රවර්ධනය සඳහා 2018 මාර්තු 21 දින ශ්‍රී ලංකා තේ මණ්ඩලය හා ගිවිසුම්ගත සමාගම අතර අත්සන් කර තිබුණු ගිවිසුමේ 3.2 ඡේදය ප්‍රකාරව ගිවිසුම් කාලය දීර්ඝ කරන්නා වූ සෑම අවස්ථාවකදීම දෙපාර්ශවය විසින් ලිඛිතව අත්සන් කරන ලද ගිවිසුමකට එළඹිය යුතු වුවත් 2021 මාර්තු 21 දින සිට 2023 මාර්තු 20 දක්වා වූ කාලයට අදාළව ගිවිසුම් කාලය දීර්ඝ කර ගැනීම සඳහා සමාගම හා මණ්ඩලය අතර අත්සන් කරන ලද ගිවිසුමක් නොතිබුණු අතර එම කාල සීමාව තුළ සමාගමට මාධ්‍ය සැළසුම් වෙනුවෙන් රු. 58,066,874 ක්ද ගෙවා තිබුණි. | සංශෝධිත ගිවිසුමේ පිටපතක් වැවිලි අමාත්‍යාංශ ලේකම් වෙත 2022/09/09 දින ඉදිරිපත් කර ඇති අතර එහි පිටපතක් වැවිලි අමාත්‍යාංශය මගින් ඉල්ලුම් කර ඇත. | ගිවිසුම ප්‍රකාරව කාලය දීර්ඝ කරන්නා වූ සෑම අවස්ථාවකදීම සමාගම හා මණ්ඩලය අතර ගිවිසුමකට එළඹිය යුතුය. |
| (ඊ) | ඉන්දු ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (ISFTA) සහ පාකිස්තාන - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (PSFTA) යටතේ තේ සඳහා මනාප ගාස්තු අනුපාතයක් (Preferential Tariff Rate Quota) පැවතියද, එහි සැලකිය යුතු උපයෝජනයක් 2021 සිට 2023 දක්වා වාර්තාකර නොතිබුණු අතර පසුගිය වර්ෂයට සාපේක්ෂව ඉන්දියාවට සහ පාකිස්ථානයට සිදුකළ මුළු අපනයන ප්‍රමාණය පිළිවෙලින් සියයට 10 කින් හා සියයට 100 කින් පහළ ගොස් තිබුණු බවද විගණනයේදී නිරීක්ෂණය විය. | අපනයන /වෙළෙඳපොල ප්‍රවේශය සීමා, සහතික කිරීම් සහ අවශ්‍යතාවයන්ට අනුකූල වීම සඳහා දිගු ප්‍රමාදයන් වැනි තීරුබදු නොවන බාධක පැවතීමේ ප්‍රතිඵලයක් ලෙස ගිවිසුම හරහා කෝටාව උපරිමව ප්‍රයෝජනයට නොගෙන පවතින අතර නිරීක්ෂණයේ සඳහන් හඳුනාගැනීම පිළිගනු ඇත. | නිදහස් වෙළඳ ගිවිසුම්තුළින් උපරිම ප්‍රතිඵල ළගාකර ගැනීමට ඇති සීමාවන් මඟහරවා ගෙන අපනයන ප්‍රවර්ධනයට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (උ) | ශ්‍රී ලංකාවේ මුළු තේ නිෂ්පාදනය හා අපනයනය ක්‍රමිකව වර්ධනය නොවීම හේතුවෙන් 2011 වර්ෂයේදි සියයට 18 ක් වූ ශ්‍රී ලංකාවේ තේ සඳහා වන ගෝලීය තේ වෙළඳපොළ කොටස (World Prod Share) සමාලෝචිත වර්ෂය වන විට සියයට 3.88 ක් දක්වා පහළ ගොස් තිබුණු බව තේ කම්වු ප්‍රවෘත්ති අතිරේකය (Supplement to Annual Bulletin of Statistics 2023) අනුව නිරීක්ෂණය වුවද වෙළඳපල කොටස වර්ධනය කර ගැනීම සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | නිරීක්ෂණය තුල හදුනාගත් පහත වැටීමක් සිදුව ඇති බව පිලිගනිමි. අනෙකුත් නිෂ්පාදන හා අපනයන රටවල් විසින් තම නිෂ්පාදනය වැඩිකිරීම හා ජාත්‍යන්තර වෙළඳපලට ඉදිරිපත් කිරීම තුළින් මේ සඳහා බලපෑම් සිදුකර ඇත. | තේ නිෂ්පාදනය වර්ධනය කරගැනීමට සහ ගෝලීය වෙළෙඳපළ තුළ ශ්‍රී ලංකාවේ තේ සඳහා වන කොටස වර්ධනය කරගැනීමට ගුණත්වයෙන් ඉහළ අන්තර්ජාතික ප්‍රමිතීන් වලට අනුකූල සුදුසු තේ වෙනුවෙන් ආයෝජන පුළුල් කිරීම සඳහා අවශ්‍ය දිරිගැන්වීම් මණ්ඩලය විසින් සිදුකළ යුතුය. |
| (ඌ) | පොහොර ලබා දීම සඳහා සියයට 8 ක පොළී පදනම මත මණ්ඩලය 2023 වර්ෂය අවසාන වනවිට තේ කර්මාන්තශාලා වෙත එකතුව රු.3,093,468,442 ක ණය ලබාදී තිබුණි. මණ්ඩලය හා අදාල පාර්ශව අතර ඇතිකරගත් ගිවිසුමේ 2.4 වගන්තිය ප්‍රකාරව නියමිත කාල සිමාව අවසානයේ ණය වාරිකය ගෙවීම අපොහොසත් වූ විට ලැබියයුතු ශේෂය මත වාර්ෂිකව සියයට 21ක ප්‍රමාද පොළියක් අයකරගත යුතු වුවත් සමාලෝචිත වර්ෂය තුළදී ප්‍රමාදවී පියවූ ණය ශේෂයයන් මත කිසිදු ප්‍රමාද පොළියක් මණ්ඩලය විසින් අයකරගෙන නොතිබුණි. | ප්‍රමාද වී ලැබූ ණය ශේෂයන් මත අය කර ගැනිමට තිබෙන ප්‍රමාද පොලිය ඉදිරියේදි මණ්ඩලය වෙත අය කර ගැනිමට කටයුතු කරනු ඇත. | කර්මාන්තශාලා සහ මණ්ඩලය අතර ඇතිකරගත් ගිවිසුම් ප්‍රකාරව අවශ්‍ය කටයුතු කළ යුතුය. |

**3.3 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රධාන ගබඩාවේ ලිපි ද්‍රව්‍ය තොග තුළ ඇතුළත්, දිගුකාලීනව චලනය නොවූ තොගයක් වශයෙන් පවතින රු.1,427,184 ක් වටිනා සෙරන්ඩීප් ටී ෆිල්ම් DVD තැටි 583 ක් සහ 2022 වර්ෂයේදීම මිලදී ගෙන තිබූ රු.1,007,580 | 2022 වර්ෂයේදී තේ කෝප්ප කට්ටල 500 ක් සකස් කරන ලද්දේ ගෝලීය ප්‍රවර්ධන වැඩසටහන යටතේ key Opinion Leaders (KOLS) විසින් සිදු කරන්නා වූ ප්‍රධානතම ප්‍රවර්ධන | අවශ්‍යතාවය නිවැරදිව හඳුනා ගනිමින් ප්‍රශස්ථ මට්ටමින් තොග මිලදීගැනීමටත් එම තොග අදාල අරමුණු සඳහා යොදා ගැනීමටත් කටයුතු කළ |

| | | |
|---|---|---|
| ක් වටිනා ටී පොට් 500 කින් ටී පොට් 420 ක් සමාලෝචිත වර්ෂය අවසාන වනවිටත් භාවිතා කර නොතිබුණි. අවශ්‍යතාවය නිවැරදිව හඳුනා නොගැනීම හේතුවෙන් සෙමින් චලනය වන සහ දිගුකාලීනව චලනය නොවූ තොග මිලදීගැනීම් සඳහා යෙදවූ අරමුදල් නිශ්කාර්යව පැවතුණි. | හා අලෙවිකරණ ක්‍රමඋපායක් වන Un-boxing ක්‍රමවේදය යටතේ මෙලෙස සිලෝන් ටී සන්නම්කරණයට ලක් කර ඇති තේ කට්ටල යොදා ගැනීම සිදු කිරීම සඳහාය. ඒ අනුව මෙලෙස නිෂ්පාදනය කරන ලද තේ කට්ටල මේ වනවිට කරන ලද KOLS ප්‍රවර්ධන කටයුතු සඳහා යොදා ගනිමින් පවතී.<br>ගබඩා තුළ ඇති සෙරන්ඩිප් ටී ෆිල්ම් 2012 වර්ෂයේදී DVD පිටපත් 1000 ක් රචනා කර ඇත. youtube මගින් බාගත කර ගැනීමට ඇති හැකියාව හේතුකොට ගෙන වර්තමානය වනවිට මෙම වීඩියෝ අලෙවිය පසුබැස ඇත. | යුතුය. |

## 3.4 ව්‍යාපෘති හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| තේ කර්මාන්තය සඳහා තොරතුරු තාක්ෂණ පද්ධතියක් සකස් කිරීම සඳහා රු.53,964,995 ක කොන්ත්‍රාත් වටිනාකමක් මත මණ්ඩලයේ සහකාර අධ්‍යක්ෂකගේ (තොරතුරු තාක්ෂණ ) තහවුරුවකින් එකතුව රු.15,716,148 ක් 2023 දෙසැම්බර් 31 වනවිට පුද්ගලික ආයතනයකට ගෙවීම් කර තිබුණි. ගිවිසුම් ප්‍රකාරව මාස 18 කදී කාර්යය නිම කල යුතු වුවද වසර 03 කට ආසන්න කාලයක් ගත වුවද පද්ධතිය සකස් කර නොතිබුණි. මෙම පුද්ගලික ආයතනය විසින් ලබා දුන් රු.26,982,497 ක කාර්යසාධන සුරක්ෂණය 2022 අප්‍රේල් 30 දින අවසන් වී තිබුණද විගණිත දින වන විටත් එය දීර්ඝ කිරීමට කටයුතු කර නොතිබුණි. | කාලසටහනට අනුව මාස 18ක කාලයක් ඇතුලත මෙම ව්‍යාපෘතිය නිම කිරීමට නියමිතව තිබුණි.<br>ගිවිසුමේ 3.5 කොන්දේසියට අනුව උක්ත ප්‍රසම්පදනයට අදාල කාර්යසාධන සුරක්ෂණය දීර්ඝ කිරීම සඳහා සැපයුම්කාර පුද්ගලික ආයතනය සමග සාකච්ඡා සිදුකොට ඇති අතර අදාල ගිවිසුම යාවත්කාලින කිරීමට අවශ්‍ය මූලික අදියරේ පියවර ගෙන ඇත. | කාර්යසාධන සුරක්ෂණය දීර්ඝ කර ගැනීමේ කටයුතු සහ තොරතුරු තාක්ෂණ පද්ධතිය ස්ථාපිත කිරීමේ ක්‍රියාවලිය කඩිනමින් අවසන් කිරීමට කටයුතු කළ යුතුය. |

## 3.5 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වර්ෂ 01ත් 04ත් අතර කාලයක සිට ඉහළ කළමනාකරණ මට්ටමට අයත් නියෝජ්‍ය අධ්‍යක්ෂ (අලෙවිකරණ), අධ්‍යක්ෂ (ප්‍රවර්ධන) සහ අධ්‍යක්ෂ (පාලන) යන තනතුරු 03 ක් | අධ්‍යක්ෂ(පාලන හා මානව සම්පත්) තනතුර පිරවීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාදී ඇති අතර එතෙක් වැවිලි කර්මාන්ත | මණ්ඩලයේ අරමුණු ඉටුකරගැනීමට හා කාර්යය සාධනය ඉහළනංවා ගැනීමට |

| | | |
|---|---|---|
| සඳහා නිලධාරීන් බඳවා ගැනීමට මණ්ඩලය විසින් කටයුතු කර නොතිබුණි. | අමාත්‍යාංශයෙන් වැඩ බැලීම සඳහා නිලධාරියෙකු පත්කර ඇත.අධ්‍යක්ෂ (ප්‍රචාරණ) තනතුර එක්සත් එමීර් රාජ්‍යය මුල්කරගෙන එම කලාපයේ තේ ප්‍රචාරණ කටයුතු ඉටු කිරීමට පවරා තිබූ තනතුර වන අතර එම තේ ප්‍රචාරණ කාර්යාලය ආරම්භ කිරීම සම්බන්ධ අවසන් තීරණය ගත් පසු එම තනතුරු පුරප්පාඩුව පිරවීමට කටයුතු කරනු ලැබේ. එසේම නියෝජ්‍ය අධ්‍යක්ෂ (අලෙවිකරණ) තනතුර අධ්‍යක්ෂ මණ්ඩල තීරණය පරිදි අදාල තනතුර යටපත් කිරීම සඳහා 2023.10.13 දිනැතිව ලේකම් වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය වෙත කෙටුම්පත් කරන ලද අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව යොමු කර ඇත. | අත්‍යවශ්‍යය තනතුරු සඳහා නිළධාරීන් බඳවා ගැනීමට සහ නිසි අනුමැතීන් මත කාර්යය මණ්ඩල සංශෝධනයට කටයුතු කළ යුතුය . |